AL/2024/41/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>Buddhism I | 41 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබගේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* ප්‍රශ්න අංක **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර (1), (2), (3), (4), (5) යන වරණ අතුරෙන් තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** බුදුරජාණන් වහන්සේගේ නවවිධ ගුණ ප්‍රකාශවන පාඨයෙහි 'බුද්ධ' යන පදයෙන් කියැවෙන්නේ,
(1) බුද්ධිමතුන් අතර අග්‍ර වන බව ය.
(2) චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගත් බව ය.
(3) අවබෝධ කරගත් ධර්මය අනුන්ට ද අවබෝධ කරවන බව ය.
(4) සියලු කෙලෙසුන් සපුරා දුරු කළ බව ය.
(5) නිවන් අවබෝධය වෙත ගමන් කළ බව ය.

**2.** බුදුරදුන් වෙත පැවති අෂ්ටවිද්‍යා ඥාණයන්ට ඇතුළත් වන ඥාණාධිගමයක් වන්නේ,
(1) නානාධිමුත්තික ඥාණයයි.
(2) ඉන්ද්‍රියපරෝපරියත්ත ඥාණයයි.
(3) ඨානාට්ඨාන ඥාණයයි.
(4) සබ්බත්ථගාමිනීපටිපදා ඥාණයයි.
(5) ආසවක්ඛය ඥාණයයි.

**3.** බුදුරජාණන් වහන්සේ අන්කිසිවෙකුට නැති සිවුවැදෑරුම් විශාරද ඥාණයකින් සමන්විත වන බව බෞද්ධ මූලාශ්‍රය සඳහන් කරයි. ඉන් එකක් නම්,
(1) මේ ආශ්‍රව ධර්ම ඔබ විසින් ප්‍රහීන කර නැතැයි කිසිවෙකුටත් කිව නොහැකි වීම ය.
(2) සත්ත්වයන්ගේ ආධ්‍යාත්මයෙහි ඇති නොයෙක් ප්‍රාර්ථනා දක්නා නුවණ ය.
(3) අනේකාකාර වූ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ සමත්වන නුවණ ය.
(4) අන්‍යයන්ගේ සිත් තම සිතින් දැක වටහාගන්නා නුවණ ය.
(5) අටවැදෑරුම් පිරිස් මැදට නොබියව එළඹීම ප්‍රකටවන නුවණ ය.

**4.** 'මාරය, මාගේ ශ්‍රාවක වූ සිවුවණක් පිරිස ධර්මය හොඳින් ප්‍රගුණ කොට අන්‍යයන්ට දේශනා කිරීමෙහි සමත්වන තුරු මම පිරිනිවන් නොපාන්නෙමියි' බුදුරදුන් විසින් පවසා ඇති සූත්‍ර දේශනාව කුමක් ද?
(1) වීමංසක සූත්‍රය.
(2) මහාපරිනිබ්බාන සූත්‍රය.
(3) ධාතුවිභංග සූත්‍රය.
(4) ලක්ඛණ සූත්‍රය.
(5) අරියපරියෙසන සූත්‍රය.

**5.** බුදුරජාණන් වහන්සේ සාමයික සහජීවනය අර්ථවත් කරමින් අන්‍ය සාමයික මහණ බමුණන් වෙත ද වැඩමකොට ධර්මය සාකච්ඡා කළහ. එසේ හමුවූ එක් අයෙක් නම්,
(1) සෝණදණ්ඩ බමුණා ය.
(2) මක්ඛලීගෝසාල ය.
(3) සකුළුදායි පිරිවැජියා ය.
(4) උපාලි ගෘහපතියා ය.
(5) දෝණ බ්‍රාහ්මණයා ය.

[දෙවැනි පිටුව බලන්න.

**6.** 'ත්‍රිපිටක ධර්මය හැඳින්වීම' යන මාතෘකාව යටතේ ශිෂ්‍යයෙකු විසින් ලියා ඉදිරිපත් කරන ලද සටහනක නිවැරදි වූයේ එක් කරුණක් පමණි. එනම්,
(1) විනයෙහි ඇතුළත් අධිශීලය ගිහි ජනයාට ද අදාළ වේ.
(2) ආනා දේශනා යනු අභිධර්ම දේශනාව ය.
(3) සූත්‍ර-විනය යන පද මුල්වරට හමුවන්නේ බුදුසමය තුළ ය.
(4) නූලක ඇමිණුවාක් මෙන් මැනවින් දක්වා ඇත්තේ සූත්‍ර දේශනාවන් ය.
(5) සංඝ සම්මතයෙන් තීරණ ගන්නා බැවින් විනය සම්මුති දේශනා නම් වේ.

**7.** බුද්ධ දේශිත පර්යාප්ති ධර්මයෙහි සන්දිට්ඨික බව බුද්ධකාලීනව පැහැදිලිව ම ප්‍රකට කළ සූත්‍ර දේශනා අතුරින් එකක් වන්නේ කවරක් ද?
(1) රතන සූත්‍රය
(2) බ්‍රහ්මජාල සූත්‍රය
(3) තිරොකුඩ්ඩ සූත්‍රය
(4) දක්ඛිණාවිභංග සූත්‍රය
(5) අග්ගඤ්ඤ සූත්‍රය

**8.** ධම්මපද දේශනාවෙහි හමුවන "සබ්බේ ධම්මා අනත්තා" යන්නෙන් ප්‍රකාශවන අර්ථය කුමක් ද?
(1) පරලොවට ගමන් කරන ආත්මයක් බුදුදහම පිළිගන්නා බව
(2) බුදුදහම ආත්ම සංකල්පය පදනම් කරගෙන නැති බව
(3) තමන්ට පිහිට වන්නේ තමන් පමණක් බව
(4) ආත්මාවබෝධය ධර්මාවබෝධය වන බව
(5) සියලු සමයවාද අනාත්මවාදී බව

**9.** බුදුදහම දේව භාෂිතයක් නොව බුදුරදුන් විසින් සත්‍ය ගවේෂණය මගින් කරන ලද අනාවරණයක් බව තහවුරු කෙරෙන සූත්‍ර දේශනාවක් වන්නේ කුමක් ද?
(1) වසල සූත්‍රය
(2) අරියපරියෙසන සූත්‍රය
(3) පරාභව සූත්‍රය
(4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය
(5) කාලාම සූත්‍රය

**10.** සඟරුවනට ඇතුළත් ආර්ය පුද්ගලයන් අටදෙනෙකු ගැන බුදුදහමෙහි සඳහන් වෙයි. එනම්,
(1) ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන පුද්ගලයන් අටදෙනා ය.
(2) අටපිරිකර පූජා කිරීමට සුදුසු පුද්ගලයන් අටදෙනා ය.
(3) සෝවාන් ආදී මාර්ගස්ථ හා ඵලස්ථ පුද්ගලයන් අටදෙනා ය.
(4) අෂ්ට විද්‍යා ඥානාධිගමය කළ පුද්ගලයන් අටදෙනා ය.
(5) අටලෝ දහමින් කම්පා වන පුද්ගලයන් අටදෙනා ය.

**11.** බුද්ධ කාලීන ශ්‍රමණ සම්ප්‍රදායට අදාළ **නොවූ** කරුණ ඇතුළත් වරණය තෝරන්න.
(1) විවිධාකාර වූ ආගමික මතවාද ඇරීම
(2) ප්‍රසිද්ධ ශාස්තෘවරුන් සදෙනෙකු දක්නට ලැබීම
(3) ආගමික ගුරුකුළ රාශියකින් සමන්විත වීම
(4) චතුර් වර්ණය පිළිගැනීම
(5) කාන්තාවන්ට ද ශ්‍රමණ ජීවිත ගත කිරීමට ඉඩ ලබාදීම

**12.** ගිහි ජීවිතය අනේකවිධ සම්බාධ සහිත යැයි සලකා ඉන් මිදීමේ අරමුණින් පැවිද්දට පිළිපන් භික්ෂුව පෙළ දහමට අනුව නිර්වචනය කළ හැක්කේ කවර ලෙසට ද?
(1) සමාජයට සේවය කරන්නා
(2) දස සීලය සුරකින්නා
(3) සිඳුණු බිඳුණු වස්ත්‍ර දරන්නා
(4) සිවුපසය පිරිනැමීමට සුදුස්සා
(5) විනයානුකූලව දිවිගෙවන්නා

**13.** බුදුරදුන් වැඩසිටි අවදිය තුළ විවිධ අරමුණු හා අවශ්‍යතා මත භික්ෂු භික්ෂුණීන් උදෙසා භාවිත වූ උපසම්පදා ක්‍රම අටක් වූ අතර ඉන් අට්ඨවාචික ක්‍රමය යනු කුමක් ද?
(1) අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දුන් විට ලබාදෙන උපසම්පදාව
(2) අෂ්ටගරුධර්ම පිළිගැනීම අනුව පිහිටන උපසම්පදාව
(3) දූතයෙකු මගින් කරනු ලබන ඉල්ලීම මත ලබාදෙන උපසම්පදාව
(4) ඤත්ති චතුත්ථ කම්මය භික්ෂූන් හා භික්ෂුණීන් විසින් ද භාවිත කොට සිදු කරන උපසම්පදාව
(5) අවවාද පිළිගැනීමෙන් පසු හිමිවන උපසම්පදාව

14. උපසපන් භික්ෂූන් වහන්සේලාට අදාළ වූ මූලික ශික්ෂා සතර පාරාජිකා නමින් හැඳින්වෙන අතර ඉන් එකකට පත්වීමෙන් භික්ෂුත්වය අහිමිවෙයි. එම සතර පාරාජිකා අතරට අයත් **නොවන** ඇවැතක් වන්නේ,
(1) මෛථුන සේවනයයි. (2) අදත්තාදානයයි.
(3) මිනිස් ජීවිතයක් නැති කිරීමයි. (4) තමා තුළ නැති ආර්ය ගුණ ඇතැයි පළකර සිටීමයි.
(5) සංඝභේදයයි.

15. සමාජයේ ඒ ඒ පුද්ගලයන් වෘත්තීන්ට අනුව ගොවියන් වෙළෙන්දන් ආදී වශයෙන් හැඳින්වෙන නමුදු උපතින් කිසිවකු කුල වශයෙන් වර්ග කළ නොහැකි බව බුදුරදුන් විසින් පෙන්වා දෙන ලද්දේ කා හට ද?
(1) පොට්ඨපාද පරිබ්‍රාජකයාට (2) සන්දක පිරිවැජියාට
(3) වාසෙට්ඨ බමුණාට (4) උපාලි ගෘහපතියාට
(5) අස්සලායන මානවකයාට

16. සියලු සත්ත්වයෝ බල රහිත වෙති. වීර්ය රහිත වෙති. හේතු ප්‍රත්‍ය රහිතව ම සත්ත්වයෝ කිළිටි ද පිරිසිදු ද වෙති'යි ප්‍රකාශ කළ බුද්ධකාලීන ශාස්තෘවරයා කවු ද?
(1) පූර්ණ කාශ්‍යප (2) මක්ඛලී ගෝසාල
(3) පකුධ කච්චායන (4) උපක ආජීවකයා
(5) සෝණදණ්ඩ බමුණා

17. දානාදි පින්කම්වල මෙන්ම ප්‍රාණඝාතාදී පාපකර්මවල ද ඵලවිපාක නැතැයි ඉගැන්වූ අජිතකේසකම්බල තුමාගේ වාදය හැඳින්විය හැක්කේ,
(1) නියතිවාදයක් ලෙස ය. (2) ශාස්වතවාදයක් ලෙස ය.
(3) අමරාවික්ඛේපවාදයක් ලෙස ය. (4) නාස්තිකවාදයක් ලෙස ය.
(5) පුබ්බේකතහේතුවාදයක් ලෙස ය.

18. සියලු පව්කම්වල හා පින්කම්වල අක්‍රිය බව පැනවූ බුද්ධකාලීන ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් බැහැර කෙරෙන බෞද්ධ මූලධර්මය වන්නේ,
(1) ත්‍රිලක්ෂණ ධර්මයයි. (2) නාමරූප විභාගයයි.
(3) සදිසා නමස්කාරයයි. (4) කර්ම විපාක සිද්ධාන්තයයි.
(5) අනාත්ම ධර්මයයි.

19. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි අන්තර්ගත සමාජ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහයට එකඟ **නොවන** කරුණ ඇතුළත් වරණය තෝරන්න.
(1) පරිසරය පිළිබඳ මානව ක්‍රියාකාරකම් පරිණාමයට තුඩු දී ඇත.
(2) පුද්ගල මානසික තත්ත්වයන් භෞතික පරිසරයට ද බලපෑවේ ය.
(3) හේතු ප්‍රත්‍ය න්‍යාය අනුව සමාජ විකාශය සිදු විය.
(4) රාජ්‍යත්වය සමාජ සම්මතයෙන් ප්‍රභවය වූවකි.
(5) පූර්ව කර්මානුරූපව ම සමාජ පරිණාමය සිදු විය.

20. කුසලතා අගය කිරීම අරමුණු කොටගෙන බුදුරජාණන් වහන්සේ විසින් සිව්වනක් පිරිසට අයත් සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට අගතනතුරු පිරිනමන ලදී. ඒ අනුව බහුශ්‍රැත උවැසියන් අතර අගතනතුර පිරිනමන ලද්දේ කාට ද?
(1) ඛුජ්ජුත්තරා උපාසිකාවට (2) සාමාවතී උපාසිකාවට
(3) නකුලමාතාවට (4) සුජාතාවට
(5) විශාඛා මහෝපාසිකාවට

21. බුදුරදුන් ධරමාන අවදියේදී ගිහි ශ්‍රාවක ශ්‍රාවිකාවෝ ද සසුනට විවිධ අනුග්‍රහ දැක්වූහ. ඒ අනුව පළමුවරට භික්ෂූන් උදෙසා ආරාම සැටක් කරවා පූජා කරන ලද්දේ කවරෙකු විසින් ද?
(1) අනේපිඬු සිටුතුමා (2) කොසොල් මහරජතුමා
(3) රජගහනුවර සිටුතුමා (4) සුදොවුන් රජතුමා
(5) විශාඛා මහෝපාසිකාව

22. ප්‍රථම ධර්ම සංගායනාවේදී ධර්ම විනයෙහි සුරක්ෂිත බවත් භික්ෂූන් වහන්සේගේ යහපැවැත්මත් උදෙසා ගන්නා ලද වැදගත් ක්‍රියාමාර්ගයක් වන්නේ කුමක් ද?
(1) සුභද්‍ර භික්ෂුව සසුනින් නෙරපා හැරීම
(2) කුඩා, අනුකුඩා ශික්ෂා මොනවාදැයි තීරණය කිරීම
(3) භාණකවරුන් පත් කිරීම
(4) ධර්මය පිළිබඳ පැන නැගී තිබූ ගැටලු විසඳීම
(5) සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සංඝ සමාජයේ නායකත්වය තීරණය කිරීම

[හතරවැනි පිටුව බලන්න.

**23.** දෙවැනි ධර්ම සංගීතිය පැවැත්වීම හා එම සංගීතියේ ප්‍රතිඵල පිළිබඳ තොරතුරු දැක්වෙන මූලාශ්‍රයක් ලෙස හැඳින්විය **නොහැක්කේ** කුමක් ද?
(1) චුල්ලවග්ගපාළිය (2) මහාවංශය (3) සමන්තපාසාදිකාව
(4) දීපවංශය (5) මහානිද්දෙසපාළිය

**24.** තෙවන ධර්ම සංගීතිය පැවැත්වීමට පසුබිම් වූ ශාසනික වාතාවරණය පැරණි පාලි මූලාශ්‍රය ඇසුරින් හඳුනාගත හැකි අතර ඒවායේ **නොදැක්වෙන** කරුණක් වන්නේ,
(1) අකැප දසවස්තුවක් කැප යැයි ඇතැම් භික්ෂූන් විසින් පිළිගැනීම ය.
(2) තීර්ථකයන් සසුනට ඇතුල් වීම ය.
(3) දිගුකලක් පොහොය පවුරුණු නොකිරීම ය.
(4) ධර්මය පිළිබඳ විවිධ පරස්පර විවරණ පැවතීම ය.
(5) භික්ෂූන් විවිධ නිකායවලට බෙදී සිටීම ය.

**25.** බුදුදහම අනුව සත්ත්වයා යැයි සම්මුති වශයෙන් හඳුන්වන ස්කන්ධ ධර්ම පඤ්චකයෙහි ඇතුළත් "සඤ්ඤා" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) සුඛ දුක්ඛාදි සංවේදනයන්
(2) කුසලාකුසල කර්මයන්
(3) සංජානනය හෙවත් අරමුණු හඳුනාගැනීම
(4) අරමුණු ඇති බව දැන ගැනීම
(5) චක්ඛු සෝතාදි ඉන්ද්‍රියයන්

**26.** සංසාරය යනු හේතුඵල ධර්මය අනුව නොසිඳී පවත්නා ස්කන්ධ ධාතු ආයතනයන්ගේ පටිපාටිය යැයි බුදුදහම උගන්වයි. එහිදී ධාතු ලෙස මෙන්ම ආයතන ලෙස ද හඳුන්වන ධර්ම අතුරින් එකක් වන්නේ කුමක් ද?
(1) පඨවි (2) චිත්ත (3) ආකාස (4) පොට්ඨබ්බ (5) ජීව

**27.** බුදුදහම අනුව ස්කන්ධ, ධාතු, ආයතනාදී වශයෙන් විශ්ලේෂණාත්මකව දක්වා ඇති සියල්ල අනිත්‍යය, දුක් සහිතය, අනාත්ම යැයි දැන දැකගන්නා තැනැත්තා තුළ ඇති වන්නේ,
(1) කලකිරීමකි. (2) විරෝධයකි. (3) පිළිකුලකි.
(4) සමාධියකි. (5) ප්‍රසාදයකි.

**28.** ප්‍රාණඝාතයෙන් වැළකී එය හැර දමා, ඒ අරමුණ ඇතිව දඬු මුගුරු භාවිත නොකර, අවි නොදරා, පවෙහි ලජ්ජා ඇතිව, සියලු සතුන් කෙරෙහි දයාවෙන්, හිතවත්බවින් හා සානුකම්පිතව වාසය කිරීම, පළමුවැනි සීල ප්‍රතිපදාව ලෙස සඳහන් වන සූත්‍රය කුමක් ද?
(1) මෙත්ත සූත්‍රය. (2) සාමඤ්ඤඵල සූත්‍රය.
(3) මෙත්තානිසංස සූත්‍රය. (4) ධම්මික සූත්‍රය.
(5) චක්කවත්ති සීහනාද සූත්‍රය.

**29.** අග්ගඤ්ඤ සූත්‍රය අනුව මිත්‍රශීලී ආකල්පයකින් තොරව අසීමිත තෘෂ්ණාවෙන් අනිසි ලෙස, පෘථිවි සාරය, බදාලතා, භූමිපප්පටක, ඇල් සහල් ආදී පාරිසරික සම්පත් පරිහරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය **නොහැක්කේ**,
(1) මිනිසුන්ගේ ආයුවර්ණාදිය පිරිහීයාමයි.
(2) මිනිසා දේව උදහසට ලක්වීමයි.
(3) පරිසර සම්පත් එකිනෙක විනාශ වීමයි.
(4) මිනිසුන් අතර ගැටුම් නිර්මාණය වීමයි.
(5) සමාජ විෂමතා ඇතිවීමයි.

**30.** මානව සමාජයේ අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් තහවුරු කෙරෙන බෞද්ධ පිළිවෙතක් ලෙස හැඳින්විය **නොහැක්කේ**,
(1) පඤ්ච ශීලයයි. (2) සිවුබඹ විහරණයයි.
(3) සිවුසඟරාවත් ය. (4) සදිසා නමස්කාරයයි.
(5) සතර සතිපට්ඨානයයි.

**31.** දම්සක් පැවැතුම් සූත්‍රය අනුව චතුරාර්ය සත්‍යාවබෝධයෙන් උපදනා යථාභූත ඥාන දර්ශනය තිපරිවට්ට ද්වාදසාකාර වන අතර එහි දුක්ඛ ආර්ය සත්‍යය,
(1) දුරු කළ යුත්තේ ය. (2) සාක්ෂාත් කළ යුත්තේ ය.
(3) වඩා වර්ධනය කළ යුත්තේ ය. (4) ඇති සැටියෙන් දත යුතු ය.
(5) අධ්‍යයනය කළ යුතු ය.

[පස්වැනි පිටුව බලන්න.

**32.** බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පවත්වමින් දුක්ඛ සමුදයාර්ය සත්‍යය පැහැදිලි කිරීමේදී දුක් හටගන්නා වූ තණ්හාව හඳුන්වා දීමට භාවිත **නොකරන** ලද ප්‍රකාශය කුමක් ද?
(1) පුනර්භවය ඇති කරවන්නකි (2) ශෝකය උපදවන්නේය
(3) නන්දිරාග සහගතය (4) ඒ ඒ භවයෙහි ඇල්ම උපදවන්නේය
(5) ත්‍රිවිධාකාරය

**33.** ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දෙවැන්න වූ සම්මා සංකප්පය පෙළ දහමෙහි තුන් ආකාරයකින් දක්වා ඇති අතර එම තුන් ආකාරය වන්නේ,
(1) නෙක්ඛම්ම, අව්‍යාපාද, අවිහිංසා, යන්නයි.
(2) අලෝභ, අදෝෂ, අමෝහ යන්නයි.
(3) දාන, සීල, පරිත්‍යාග යන්නයි.
(4) මෙත්තා, කරුණා, මුදිතා යන්නයි.
(5) දාන, සීල, භාවනා යන්නයි.

**34.** බුදුරදුන් විසින් හේතුඵල දහම අනුව සන්තානගත හා සමාජගත දුක විවරණය කළ සූත්‍ර දේශනාව කුමක් ද?
(1) චක්කවත්ති සීහනාද සූත්‍රය (2) රතන සූත්‍රය
(3) බහුවේදනීය සූත්‍රය (4) ධජග්ග සූත්‍රය
(5) ධාතුවිභංග සූත්‍රය

**35.** බුද්ධ කාලීන මහණ බමුණන්ගෙන් ඇතැම්හු පරලොවක් නොපිළිගන්නා උච්ඡේදවාදීන් වූහ. එම චින්තනයෙන් මිනිසුන් යොමු වන්නේ,
(1) ආත්ම දමනය වෙත ය. (2) විවිධ ආගමික ව්‍රත සමාදානය වෙත ය.
(3) සැප සම්පත් අතහැර වනගත වීමට ය. (4) යාගහෝම කිරීමට ය.
(5) උපරිම කම්සැප විඳීමට ය.

**36.** ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ආකල්පය අර්ථවත් වන ප්‍රකාශය කුමක් ද?
(1) සියල්ල සිදු වන්නේ ඊශ්වරගේ කැමැත්ත පරිදි ය.
(2) පූර්ව කර්මය අනුව ම සියල්ල සිදුවෙයි.
(3) සියල්ල සිදු වන්නේ නියත ධර්මතාවයකට අනුව ය.
(4) මානව ශක්‍යතාවයෙන් සියල්ල ජයගත හැකි ය.
(5) සියල්ල සිදු වන්නේ අහේතුවක ය.

**37.** මෛථුන සේවනය අතහැර ගතකරන ජීවිතය බුදුදහමේ උගන්වන බ්‍රහ්මචරියාවේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි ය. බෞද්ධ ශීල ප්‍රතිපදාවන් අතර එම බ්‍රහ්මචරියාව ඇතුළත් **නොවන්නේ**,
(1) ගිහි දශ ශීලයේ ය. (2) උපෝසථ අෂ්ටාංගික ශීලයේ ය.
(3) ආජීව අෂ්ටමක ශීලයේ ය. (4) සාමණේර දශ ශීලයේ ය.
(5) පඤ්ච ශීලයේ ය.

**38.** සංසාරගත සත්ත්වයාට ආයු, වර්ණ, සැප, බල ලබාදෙන පුණ්‍ය ක්‍රියාවන් දහයක් බුදුදහමේ ඉගැන්වෙයි. ඉන් එකක් වන පත්තානුමෝදනා යන්නෙන් කියැවෙන්නේ,
(1) පින් අනුමෝදන් වීම ය. (2) වතාවත් කිරීම ය.
(3) පිදිය යුත්තන් පිදීම ය. (4) වැඩිහිටියන්ට සැලකීම ය.
(5) පින්කම් කිරීම ය.

**39.** ත්‍රිවිධ රත්නයේ සූවිසි ගුණ පිළිබඳ මනා අවබෝධයක් ඇතිව සිටි එක් උපාසිකාවක් වන්දනා මාන කිරීමේදී ද එම ගුණ කියවෙන පාඨවල අර්ථය මෙනෙහි කිරීමට පුරුදු වී සිටියා ය. පෙළ දහම අනුව ඇය තුළ පැවැතියේ කුමන ගුණයක් ද?
(1) තෙරුවන් පිළිබඳ බලවත් විශ්වාසයයි (2) තෙරුවන් ගුණ ඇදහීමයි
(3) ආකාරවතී ශ්‍රද්ධාවයි (4) ශ්‍රද්ධා භක්තියයි
(5) අමූලිකා සද්ධාවයි

**40.** විපාක දෙන ආකාරය අනුව කර්මය චතුර්විධ ය. එහි සිවුවැනිව දැක්වෙන කටත්තා කර්ම යනු,
(1) සසර ඉපදීමට හේතුවන කුසලාකුසල කර්මයි.
(2) බලවත් චේතනාවකින් තොර වූ හුදෙක් ක්‍රියාමාත්‍ර වූ කර්මයි.
(3) නැවත නැවතත් පුරුදු කරන ලද කුසලාකුසල කර්මයි.
(4) සසර සුවදුක් ලැබීමට උපකාරීවන කර්මයි.
(5) බලවත් වූ කුසලාකුසල කර්මයි.

**41.** බෞද්ධ ආර්ථික දර්ශනය බිහිවන්නේ මූලික සූත්‍ර දේශනා රාශියක් පාදක කොටගෙනයි. එම සූත්‍ර දේශනා අතුරින් එකක් නම්,
(1) රාසිය සූත්‍රයයි.
(2) දම්සක් පැවැතුම් සූත්‍රයයි.
(3) මහාවේදල්ල සූත්‍රයයි.
(4) මහාතණ්හාසංඛය සූත්‍රයයි.
(5) බ්‍රහ්මජාල සූත්‍රයයි.

**42.** පුද්ගල ආර්ථිකයෙහි සුරක්ෂිත බව නැති වීමට තුඩුදෙන කරුණු හතරක් කුල සූත්‍රය පෙන්වාදෙයි. ඉන් එක් කරුණක් නම්,
(1) අය වැය සමව පවත්වා නොගැනීමයි.
(2) විවිධ හේතු දක්වා කර්මාන්ත නොකිරීමයි.
(3) චරිතයෙන් පිරිහුණු ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ප්‍රධානත්වයෙහි තැබීමයි.
(4) කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් තොරවීමයි.
(5) ඉපයීම්වලින් දෙකොටසක් ආයෝජනය නොකිරීමයි.

**43.** ප්‍රජාවගේ යහපත කැමති රාජ්‍ය පාලකයෙකු විසින් මූලික වශයෙන් අනුගමනය කළ යුතු පිළිවෙත් දහයක් දසරාජ ධර්ම නමින් බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. එහි 'මද්දවං' යන්නෙන් කියැවෙන්නේ කුමක් ද?
(1) රජු මත්පැන් පානය නොකළ යුතු බව
(2) ප්‍රජා කටයුතුවලදී සංවේදී විය යුතු බව
(3) මාත්‍රාව හෙවත් සීමාව දැන කටයුතු කළ යුතු බව
(4) අසීමිත ආශාවන් නිසා මත් නොවිය යුතු බව
(5) මදයෙන් ප්‍රමාද නොවිය යුතු බව

**44.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර වැදගත් තැනක් ගන්නා සප්ත අපරිහාණීය ධර්මවල ඇතුළත්වන පිළිවෙතක් වන්නේ, පාලකයා
(1) තම කැමැත්තට වහල්ව අනිසි ක්‍රියාවන්ට යොමු නොවීමයි.
(2) ධර්මානුකූලව රාජ්‍ය පාලනය කිරීමයි.
(3) ප්‍රජා සුබසාධනයට යොමු වීමයි.
(4) වැඩිහිටියන්ට ගරු කිරීමයි.
(5) බ්‍රාහ්මණ ගෘහපතියන්ට දැහැමි රැකවරණය සැලසීමයි.

**45.** බෞද්ධ ඉගැන්වීම් අනුව රාජ්‍යත්වය ජන සම්මතයෙන් ප්‍රභවය වූවක් බව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?
(1) චක්කවත්ති සීහනාද සූත්‍රය
(2) රාජෝවාද ජාතකය
(3) මහාපරිනිබ්බාන සූත්‍රය
(4) කූටදන්ත සූත්‍රය
(5) අග්ගඤ්ඤ සූත්‍රය

**46.** ආලාරකාලාමාදි සමකාලීන ශ්‍රමණ පැවිද්දන්ගේ ප්‍රතිපදාව ඉක්මවා බෞද්ධ භාවනා ක්‍රමය ඉදිරි පියවරක් පෙන්වා දී ඇතැයි කිව හැක්කේ,
(1) විපස්සනාව ඉගැන්වීමෙනි.
(2) ඍද්ධි ප්‍රාතිහාර්ය දැක්වීමේ හැකියාව ලබාගැනීමෙනි.
(3) දිබ්බචක්ඛු ඤාණය උපදවා ගැනීමට මග පෙන්වීමෙනි.
(4) කෙලෙස් යටපත් කිරීමේ මග හෙළි කිරීමෙනි.
(5) අෂ්ටසමාපත්ති ලාභයට යොමුවීමෙනි.

**47.** සතර සතිපට්ඨානයේ චිත්තානුපස්සනාව තම සිත තමා විසින්ම දැකීමට අදාළ ආකාර සොළසක් උගන්වන අතර, ඉන් එකක් නම්,
(1) නීවරණ ධර්මයන් තමා තුළ ඇති නැති බව මෙනෙහි කිරීමයි.
(2) ශරීරය දෙතිස් කුණපයකින් යුක්ත බව තේරුම් ගැනීමයි.
(3) සතර ඉරියව්වෙහි ම සිහිනුවණ ඇති කර ගැනීමයි.
(4) මහග්ගත සිත මහග්ගත යැයි දැන දැක ගැනීමයි.
(5) විඳිනු ලබන වේදනාවන් ඇති සැටියෙන් දැකීමයි.

**48.** මෛත්‍රී කර්මස්ථානය වැඩීමේදී සුවපත් වෙත්වා! නිදුක් වෙත්වා! නිරෝගී වෙත්වා! යනුවෙන් තමාගෙන් අනතුරුව පළමුවෙන්ම මෙත් වැඩිය යුත්තේ,
(1) තම සතුරන්ට ය.
(2) හිතවතුන්ට ය.
(3) සියලු සතුන්ට ය.
(4) වඩාත් ප්‍රියමනාප අයට ය.
(5) දුකට පත්වූවන්ට ය.

[හත්වැනි පිටුව බලන්න.

**49.** භාවනා කිරීම සඳහා කර්මස්ථාන ලබාදෙන ආචාර්යවරයා වෙත තිබිය යුතු ගුණාංග රාශියක් බෞද්ධ මූලාශ්‍රය සඳහන් කරයි. ඉන් එකක් **නොවන්නේ,**
(1) ගල් පියස්සක් මෙන් බරසාර වීමයි.
(2) ගුණයන් නිසා බුහුමන් දැක්වීමට සුදුසු වීමයි.
(3) සිය මතයට ම ගරුකරන්නෙකු වීමයි.
(4) ධ්‍යාන ලැබූවෙකු හෝ පෙළඅටුවා දරන්නෙකු වීමයි.
(5) ගැඹුරු ධර්ම කථා කියාදෙන්නෙකු වීමයි.

**50.** විපස්සනා වැඩීමෙන් බෞද්ධයෙකුට ලැබෙන ආනිසංස අතරට **නොවැටෙන්නේ,**
(1) තිලකුණු ඇති සැටියෙන් දැකීමයි.
(2) ප්‍රඥා ප්‍රතිලාභයයි.
(3) ආසවක්ඛය ඥාණය උපදවා ගැනීමයි.
(4) මරණින් මතු බඹලොව උපත ලැබීමයි.
(5) චතුරාර්ය සත්‍යාවබෝධයයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| බුද්ධ ධර්මය | II |
| பௌத்தம் | II |
| Buddhism | II |

**41 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) 'භගවා' බුදුගුණය හඳුන්වා දෙන්න. (ලකුණු 02යි.)
(ii) ඉන්ද්‍රියපරෝපරියත්තඤාණය කුමක්දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)
(iii) බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය විවරණය කරන්න. (ලකුණු 06යි.)
(iv) පටිපුච්ඡා ව්‍යාකරණීය යන්න නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 08යි.)

**2.** (i) ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
(ii) "බුදුදහම ඊශ්වර නිර්මාණවාදය බැහැර කරයි" විමසන්න. (ලකුණු 04යි.)
(iii) ඉගැන්වීම් **දෙකක්** ඇසුරෙන් බුදුදහමේ විශ්ව සාධාරණ බව ප්‍රකට කරන්න. (ලකුණු 06යි.)
(iv) විමුක්ති මාර්ගයක් ලෙස බුදුදහම පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08යි.)

**3.** (i) බුද්ධ කාලීන ප්‍රකට පිරිවැජියන් **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02යි.)
(ii) සරණාගමන පැවිද්ද අර්ථකථනය කරන්න. (ලකුණු 04යි.)
(iii) ඕවාදපටිග්ගහණ උපසම්පදාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)
(iv) භික්ෂුත්වයෙන් ප්‍රකටවන අපිස්බව නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 08යි.)

## II කොටස

**4.** (i) පුබ්බෙකත හේතුවාදය පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 08යි.)
(ii) පුබ්බෙකත හේතුවාදය පිළිබඳ බෞද්ධාකල්පය ගෙනහැර දක්වන්න. (ලකුණු 12යි.)

**5.** (i) දෙවන ධර්ම සංගීතියට තුඩුදුන් ශාසනික වාතාවරණය කෙබඳුදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)
(ii) දෙවන සංගායනාවේදී ශාසන චිරස්ථිතියට ගත් පියවර මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 12යි.)

**6.** (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෝකෝත්තර උපයෝගීතාව පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)
(ii) අවිජ්ජාදි ද්වාදසාංග පටිච්චසමුප්පාදය අනුව දුක්ඛ සමුදය පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

**7.** (i) බුදුසමය අනුදත් ධාර්මික ධනෝපායනය ඇගයුමට ලක් කරන්න. (ලකුණු 08යි.)
(ii) ධන පරිහරණය පිළිබඳ බුද්ධාවවාද මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 12යි.)

**8.** (i) "විදර්ශනා භාවනාව යථාර්ථාවබෝධය උදා කරයි." පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)
(ii) අසුභානුස්සතිය මූලාශ්‍රය ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 12යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහසය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 41 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්‍ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්‍ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 41 - බුද්ධ ධර්මය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I - පත්‍රය** - **කාලය : පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්ණ 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**II - පත්‍රය** - **කාලය : පැය 03 යි**

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත ප්‍රශ්න 03 කින් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 05 කි. ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60 කි.

අවසාන ලකුණ ගණනය කිරීම : I පත්‍රය = 50
II පත්‍රය = 100

**අවසාන ලකුණ :** $50 + \left(\frac{100}{2}\right) = \underline{\underline{100}}$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) .................................................. √ △ $\frac{4}{5}$

(ii) .................................................. √ △ $\frac{3}{5}$

(iii) .................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂය අංකය / பாட இலக்கம்: 41

විෂයය / பாடம்: බුද්ධ ධර්මය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 3 | 31. | 4 | 41. | 1 |
| 02. | 5 | 12. | 3 | 22. | 3 | 32. | 2 | 42. | 3 |
| 03. | 1 | 13. | 4 | 23. | 5 | 33. | 1 | 43. | 2 |
| 04. | 2 | 14. | 5 | 24. | 1 | 34. | 1 | 44. | 4 |
| 05. | 3 | 15. | 3 | 25. | 3 | 35. | 5 | 45. | 5 |
| 06. | 4 | 16. | 2 | 26. | 4 | 36. | 4 | 46. | 1 |
| 07. | 1 | 17. | 4 | 27. | 1 | 37. | 5 | 47. | 4 |
| 08. | 2 | 18. | 4 | 28. | 2 | 38. | 1 | 48. | 4 |
| 09. | 2 | 19. | 5 | 29. | 2 | 39. | 3 | 49. | 3 |
| 10. | 3 | 20. | 1 | 30. | 5 | 40. | 2 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

## I කොටස

1. (i) 'භගවා' බුදුගුණය හඳුන්වා දෙන්න. (ලකුණු 02යි.)

හගවා යන්නෙන් භාග්‍යවත් බව, සමෘද්ධිය, කීර්තිය යනාදි අර්ථ ප්‍රකාශවන බව.
බුදුගුණ අලංකාරයෙහි එන එම බුදුගුණය කියැවෙන කවිය දක්වා තේරුම් කර තිබීම.

(ii) ඉන්ද්‍රියපරෝපරියත්තඤාණය කුමක්දැයි කෙටියෙන් පහදන්න. (ලකුණු 04යි.)

සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන්හි වෘද්ධිය හා පිරිහීම තතුසේ දක්නා නුවණ, ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය නම් වන බව. මෙහිදී ඉන්ද්‍රිය යන්නෙන් අර්ථවත් වන්නේ චක්ෂුරාදි ඉන්ද්‍රිය නොව ඉහත කී ශ්‍රද්ධාදී ගුණධර්ම බව.

(iii) බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය විවරණය කරන්න. (ලකුණු 06යි.)

අටලෝදහමින් කම්පා නොවීම, ලෞකික ධර්මයෙහි නොඇලෙන බව, පද්මාකාර ජීවිතය යන්නෙන් අදහස් වන බව. දියෙහි ඉපිද, එහිම වැඩී, ඉන් මතුවී, ඒ හා නොගැටී නො තැවරී සුවඳවත්ව මනෝරම්‍යව බැබලෙන නෙලුමක් මෙන් බුදුරදුන් කෙලෙස් මඩ වගුරෙහි ගිලී සිටින පුහුදුන් මිනිසුන් අතර ඉපිද එහි නොතැවරී සිටින බව.

(iv) පටිපුච්ඡා ව්‍යාකරණීය යන්න නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 08යි.)

අසන්නාගෙන් ප්‍රතිප්‍රශ්න අසමින් එයින්ම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම මින් අදහස් වන බව. මෙය චතුර්විධ ප්‍රශ්න ව්‍යාකරනවල සිව් වැන්න බව. පෙළ දහම ඇසුරින් බුදුරදුන් මෙම ක්‍රමය භාවිත කළ ඇයුරු ප්‍රකට වන නිදසුන් දෙකක්වත් දැක්වීම අවශ්‍යය. සච්චක, සෝණදණ්ඩ ආදී සූත්‍ර නිදසුන් ලෙස දැක්විය හැකිය.

2. (i) ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ හතරක් නම් කරන්න. (ලකුණු 02යි.)

ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක ආදී වශයෙන් ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15 න් කිසියම් ග්‍රන්ථ හතරක් නම් කිරීම.

(ii) "බුදුදහම ඊශ්වර නිර්මාණවාදය බැහැර කරයි" විමසන්න. (ලකුණු 04යි.)

ලෝකයේ බොහෝ සමයවාදයන් මැවුම්කාර ඊශ්වරයෙකු පිළිගන්නා බැවින් ඊශ්වර නිර්මාණවාදය පදනම් කරගෙන ඇති බව. එනමුදු බුදුදහම එය පදනම් කර නොගෙන ත්‍රිලක්ෂණය, පටිච්චසමුපාදය ආදී මූලධර්ම පදනම් කරගෙන ඇති බව. ලෝකය හා සත්වයාගේ පැවැත්ම හේතුප්‍රත්‍ය න්‍යායට අනුගතව උගන්වා ඇති බව. ස්වච්ඡන්දතාව, නිදහස වගකීම හා කර්ම විපාකාදිය පිළිගන්නා බුදුසමයෙහි ඊශ්වර නිර්මාණ වාදය පසෙකින් තබන බව.

**(iii) ඉගැන්වීම් දෙකක් ඇසුරෙන් බුදුදහමේ විශ්ව සාධාරණ බව ප්‍රකට කරන්න.** (ලකුණු 06යි.)

බුදුසමයෙහි මූලධර්ම ලෙස සැලකිය යුතු චතුරාර්ය සත්‍ය, ත්‍රිලක්ෂණය, පටිච්චසමුප්පාදය, මධ්‍යම ප්‍රතිපදාව හා කුසලාකුසල කර්ම ආදී ඉගැන්වීම් අතරින් දෙකක් ඇසුරු කොටගෙන බුදුදහම විශ්ව සාධාරණ ලක්ෂණ ප්‍රකටකරණ බව පෙන්වාදීම. එකී බෞද්ධ ඉගැන්වීම් දේශ, කාල, ජාති වශයෙන් වෙනස් නොවන බව.

**(iv) විමුක්ති මාර්ගයක් ලෙස බුදුදහම පිළිබඳ ඇගයීමක් කරන්න.** (ලකුණු 08යි.)

බුදුසමයෙහි දැක්වෙන විමුක්ති මාර්ගය මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වන අතර එය පාරභෞතික සංකල්ප මාත්‍රයක් හෝ විශ්වාස මාත්‍රයක් නොවන අතර අනුපූර්ව ශික්ෂාවක්, ක්‍රියාවක් හා ප්‍රතිපදාවක් වන බව පැහැදිලි කිරීම. ආර්ය මාර්ගයෙහි ගමන් කරන්නාට සත්තිස් බෝධිපාක්ෂිකධර්ම ප්‍රගුණ කළ හැකි අතර, එය විමුක්තියට මගවන බව. සසර දුක් සහිතය යන අවධිකම ඇතිව ඉන් අත්මිදීම තුළින් ලබන විමුක්තියක් බුදුදහමේ ඉගැන්වෙන බව.

**3. (i) බුද්ධ කාලීන ප්‍රකට පිරිවැජියන් දෙදෙනෙක් නම් කරන්න.** (ලකුණු 02යි.)

වච්ඡගොත්ත, පොට්ඨපාද, සකුළුදායි ආදී බුද්ධ කාලීනව විසූ පෙළ දහමෙහි හමුවන පිරිවැජියන් අතුරින් දෙදෙනෙකු නම් කිරීම.

**(ii) සරණාගමන පැවිද්ද අර්ථකථනය කරන්න.** (ලකුණු 04යි.)

බුදුරදුන් විසින් අනුදක්නා ලද බෞද්ධ පැවිද්ද එහිභික්ඛු හා සරණාගමන පැවිද්ද යනුවෙන් දෙයාකාර වන බව. සරණාගමන පැවිද්ද පනවන ලද්දේ භික්ෂූන් වෙත බලය විමධ්‍යගත කිරීමත් සමග වන බව. හිස මුඩුකර, කසාවත් හන්දවා, තිසරණ සමාදන් කරවීමෙන් පැවිදි කිරීම මින් අදහස් වන බව.

**(iii) ඕවාදපටිග්ගහණ උපසම්පදාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න.** (ලකුණු 06යි.)

ඕවාදපටිග්ගහණ උපසම්පදාව යනු බුදුරදුන් දුන් අවවාද පිළිගැනීම තුළින් සිදුකරන ලද උපසම්පාදාව වන බව. භික්ෂූන් කෙරෙහි හිරිඔතප් දෙකින් යුතුව හික්මීම, ධර්ම ශ්‍රවනයෙන් අර්ථාවබෝධය වෙත යොමු වීම. කායගතා සතියෙන් වාසය කිරීම යන අවවාද පිළිගැනීම. මහාකාශ්‍යප හිමියන් මෙම ක්‍රමයට උපසම්පදා කළ බව.

**(iv) භික්ෂුත්වයෙන් ප්‍රකටවන අපිස්බව නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.** (ලකුණු 08යි.)

භික්ෂුව මහිච්ඡතාවෙන් හෙවත් අධික තෘෂ්ණාවෙන්, අසීමිත බලාපොරොත්තුවලින් තොරව ලද දෙයින් සතුටුව, අල්ප ඉච්ඡා ඇතිව දිවිගෙවන, හිස මුඩු කිරීමෙන්, කසාවත් දැරීමෙන්, එක් වේලක් වැළඳීමෙන්, බ්‍රහ්මචාරී වීමෙන් අපිස් ගුණය ප්‍රකට කරන බව. චතුර්විධ නිස්සය ධර්ම සඳහන් කිරීම ද ප්‍රමාණවත් පිළිතුරකට අදාළය.

## II කොටස

**4. (i) පුබ්බේකත හේතුවාදය පිළිබඳ විවරණයක් කරන්න.** (ලකුණු 08යි.)

පුබ්බේකත හේතුවාදය අනුව සියල්ල පූර්ව කර්මානුරූපව සිදුවේ යැයි සැලකෙන බව, සුවදුක් විඳීම පෙර කර්ම අනුවම සිදුවන බව පිළිගැනීම. නිගන්ථ නාථපුත්තතුමා මෙම වාදය ඉගැන්වූ බව. කර්මක්‍ෂය කිරීම කේවලත්වය පසක් කිරීමට උපකාරීවේ යැයි මෙහි ඉගැන්වෙන බව යනාදී කරුණු විස්තර කිරීම.

**(ii) පුබ්බේකත හේතුවාදය පිළිබඳ බෞද්ධාකල්පය ගෙනහැර දක්වන්න.** (ලකුණු 12යි.)

පුබ්බේකත හේතුවාදයෙන් ස්වච්ඡන්දතාව ප්‍රතික්ෂේප වන බැවින් ද, පුද්ගලයාට අර්ථවත් ක්‍රියාමාර්ග වෙත එළඹීමට එමගින් බාධා ඇතිවන බැවින් ද, කර්මක්‍ෂය කිරීම වැනි ජෛන ප්‍රතිපදා බුදුසමය පසෙකින් තබන බැවින් ද, මෙම ඉගැන්වීම නියතිවාදයක් වන බැවින්ද එහි ශ්‍රමණවාදයක් නැතැයි බුදුරදුන් පෙන්වාදුන් බව ද දැක්වීම.

**5. (i) දෙවන ධර්ම සංගීතියට තුඩුදුන් ශාසනික වාතාවරණය කෙබඳුදැයි පැහැදිලි කරන්න.** (ලකුණු 08යි.)

විශාලා නුවර වජ්ජිපුත්‍රික භික්ෂූන් අකැප දසවස්තුවක් කැප යැයි පිළිගැනීම. එය අකැප යැයි පෙන්වාදුන් භික්ෂූන්ට එරෙහි වීම. එහිදී කාකණ්ඩපුත්ත යස හිමියන්ට වජ්ජිපුත්ත්‍රික භික්ෂූන් විසින් පටිසාරණීය හා උක්ඛේපණීය කර්ම සිදු කිරීම ආදී සිදුවීම් මුල් කරගත් අර්බුද දෙවැනි ධර්ම සංගීතියට පසුබිම් වූ බව. ථෙරවාද නොවන මූලාශ්‍රයවල මෙම සංගීතිය පැවැත්වීමට පසුබිම වූ වෙනත් කරුණු සඳහන් වන බව.

**(ii) දෙවන සංගායනාවේදී ශාසන චිරස්ථිතියට ගත් පියවර මොනවාදැයි පෙන්වා දෙන්න.** (ලකුණු 12යි.)

දස වස්තුව විනය විරෝධී බව තීරණය කිරීම. එය පිළිගත් භික්ෂූන් සසුනින් නෙරපා හැරීම. පාවානුවර, අවන්ති හා දක්ෂිණාපථ ප්‍රදේශවලින් භික්ෂූන් කැඳවා උබ්බාහිකාවක් පත්කර එමගින් දස වස්තුව අකැප බව තීරණය කිරීම. ථෙරවාදී ධර්ම විනය නිර්මලව රැක ගැනීමට කටයුතු කිරීම ආදී කරුණු විස්තර කිරීම.

**6. (i) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෝකෝත්තර උපයෝගීතාව පැහැදිලි කරන්න.** (ලකුණු 08යි.)

ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාව පිරිමෙන් අනුක්‍රමයෙන් ලෞකික බවෙන් අත් මිදීමට මග පෙන්වන බව. ජාති, ජරා, ව්‍යාධි, මරණාදී දුක් දොම්නසවලින් මිදීම ඔස්සේ ලෞකික ලෝකයට අයත් දුක් දොම්නස්වලින් එතෙර වීමට ආර්ය මාර්ගය උපකාරී වනබව. ආර්ය අෂ්ටාගිංක මාර්ගයේ ඒ ඒ මාර්ග අංග ලෞකික වූ කාමයෙන්, අකුසලයෙන් එතෙරවීමට හෙවත් ලෝකෝත්තර තත්ත්වට පත්වීමට උපකාරී වනබව.

(ii) අවිජ්ජාදි ද්වාදසාංග පටිච්චසමුප්පාදය අනුව දුක්ඛ සමුදය පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

චතුරාර්ය සත්‍ය අනවබෝධය නිසා කුසලාකුසල ශක්තිය ක්‍රියාත්මක වන බවද, ඒ හේතුවෙන් ප්‍රතිසන්ධි විඥානය ද, එමගින් නාමරූප ධර්ම ද, ඒ හේතුවෙන් සළායතනයන් ද, එමගින් ස්පර්ශය ද, ඉන් විඥානය ද, එමගින් තෘෂ්ණාව ද, ඉන් උපාදානය ද, එමගින් භවය ද, එයින් ඉපදීම ද, එයින් ජරා මරණාදී සියලු දුක් ද හටගන්නා බව. මෙසේ හේතු ප්‍රත්‍යාකාරයෙන් දුක්ඛ සමුදය වන බව.

7. (i) බුදුසමය අනුදත් ධාර්මික ධනෝපායනය ඇගයුමට ලක් කරන්න. (ලකුණු 08යි.)

සම්මා ආජීවය උගන්වන බුදුරදුන් නොකළ යුතු වෙළෙඳාම් ආදිය දක්වා ඇති අතර බඹරෙකු මලින් රොන් ගන්නා සේ ධනය ඉපයිය යුතු යැයි පෙන්වා දී තිබීම. එය ධාර්මික ධනෝපායනය වන බව. එමගින් යුක්තිගරුක හා නීතිගරුක සර්ව සාධාරණ සමාජයක් නිර්මාණය වන බව ද එසේම මිථ්‍යා දිවිපැවතුම්වලින් බැහැරව යහපත් දිවිපැවැතුම්වලට ප්‍රජාව යොමු කරමින් සමකාමී සමාජයකට මග පෙන්වන බව.

(ii) ධන පරිහරණය පිළිබඳ බුද්ධාවවාද මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 12යි.)

ව්‍යග්ගපජ්ජ සූත්‍රය, රාසිය සූත්‍රය, පත්තකර්ම සූත්‍රය, සිගාල සූත්‍රය ආදී සූත්‍රයන් හි දැක්වෙන කරුණු ඇසුරින් ධන පරිහරණය පිළිබඳ බුද්ධාවවාද දැක්වීම.

8. (i) "විදර්ශනා භාවනාව යථාර්ථාවබෝධය උදා කරයි." පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

විපස්සනා භාවනාවේදි රූපාදී ස්කන්ධ ධර්මයන් අනිත්‍යය, දුක්ඛයැයි අවධිකමක් ඇති කර ගැනීම සිදුවන බව. එමගින් ලෝකය හා සත්ත්වයා පිළිබඳ යථාතාර්ථවබෝධය ඇතිකරවන බව. (යථාභූතඥානදර්ශනය) එම අවධිකමට සමගාමීව නිර්වේදය, විරාගය, විමුක්තිය සාධනය වන බව පෙන්වාදීම.

(ii) අසුභානුස්සතිය මූලාශ්‍රය ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 12යි.)

කෙස්, ලොම්, හිස, දත් ආදී වශයෙන් දැක්වෙන දෙතිස් කුණුප කොට්ඨාසයකින් මේ සිරුර සමන්විත යැයි සිහි කිරීම අසුභ භාවනාව වනබව. පැහැය, සටහන්, ගන්ධය ඇසුරු කරන තැන් පිහිටි තැන් යන පස් ආකරයකින් මෙකී දෙතිස් කුණුප පිළිකුල් සහගත යැයි භාවනා වශයෙන් සිහියට නගා ගැනීම, මෙම භාවනාවට අයත්වන බව. සමස්තයක් වශයෙන් ශරීරයෙහි ප්‍රකටවන අසාරත්වය සුභ නොවන ස්වරූපය දැන දැක ගැනීමට මෙම භාවනාව මගින් ඉඩ සැළසෙන බව විස්තර කිරීම.